## අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස්විය යුත්තේ කෙසේ ද?

නව අධ්‍යාපන ඇමති බන්දුල ගුණවර්ධන මහතා හැට්දින අධ්‍යාපන කතිකාවතකට සැරසෙයි. ඒ කතිකාවතට සහභාගිවන්නන් කවුරුන්දැයි මම නො දනිමි. මෙරට අධ්‍යාපනය අපේ පැත්තෙන් බැලූ කල තුට්ටු දෙකක් නොවටිනා දෙයක් ලෙස සලකන, ලබන ලද අධ්‍යාපනයෙන් කැඩි වෙන්වීමට සමත් වූවකු ලෙස මා මේ ලිපිය ලියන්නේ බන්දුල ගුණවර්ධන මහතා මගේ අදහස් පිළිගනී ය යන බලාපොරොත්තුවෙන් නො වේ. මා දශක දෙකකට වැඩි කාලයක් හඳුනන බන්දුල ගුණවර්ධන මහතා අධ්‍යාපනය සම්බන්ධයෙන් දරන්නේ මා දරණ අදහස් නොවන බව මම දනිමි. මා එවැනි ම කාලයක් හඳුනන උසස් අධ්‍යාපනය පිළිබඳ ඇමති එස් බී දිසානායක මහතා ගුණවර්ධන මහතා තරමටවත් මා සමග එකඟ නො වේ. එපමණක් නොව කතිකාවතට සහභාගි වීය හැකි විද්වතුන් අතර විවිධ මත තිබුණ ද ඔවුන් සියලු දෙනා ම පාහේ මෙහි පළවන අදහස් නොපිළිගැනීමට ඇති සම්භාවිතාව අධික ය.

මේ ලිපිය එක් ප්‍රශ්නයකට සීමා කරනු කැමැත්තෙමි. අද ලෝකයේ සිටින ප්‍රධානතම විශ්වවේදියා ලෙස සැලකෙන මහාචාර්ය ස්ටීවන් හෝකින් මහතා පසුගිය දා වැදගත් ප්‍රකාශයක් කර තිබිණි. ඔහු කියා තිබුණේ පිට සක්වළ සිට දියුණු ජීවීන් මෙහි පැමිණියහොත් ඔවුන් අප පෘථිවි වැසියන් යටත්කරගනු ඇති බව ය. වෙනත් අයුරකින් කිවහොත් කොලම්බස් ඇමරිකාවේ දි කළ දේ මෙහි දී පිටසක්වළ ජීවීන් කරනු ඇති බව ය. අඩුම තරමින් පෘතුගීසීන් අප රටේ සිදුකළ යටත්විජිතකරණය පිටසක්වළ ජීවීන් කරනු ඇති බව ය.(අපේ කසිකබල් අධ්‍යාපනය ද බටහිර යටත්විජිතකරණයේ ප්‍රතිඵලයකි පිටසක්වළ වැසියන් අපට කිනම් අධ්‍යාපනයක් දෙනු ඇත් දැයි හෝකින් මහතා කියා නැත) මගේ ප්‍රශ්නය ඔබ හෝකින් මහතා සමග එකඟවන්නේ ද නැත් ද යන්න ය. මට නම් ඔහු සමග එකඟ විය නො හැකි ය. හෝකින් මහතා කියන පිටසක්වළ ජීවීන්ගේ පැවැත්මට යම් සම්භාවතාවක් නැතිවා නො වේ. එහෙත් හෝකින් මහතා දරණ අදහස් ඔහුගේ සංස්කෘතියට හා අධ්‍යාපනයට සාපේක්ෂ බව බොහෝ දෙනාට නො තේරෙයි. ඔහුට ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් බිහි කෙරුණු දැනුම ය. ඔහුගේ සංස්කෘතියට අයත් වූවෝ, එනම් දියුණු යැයි සැලකෙන ජාතීහු ලෝකය වටා ගොස් යටත්විජිත ඇති කළහ. අනෙක් සංස්කෘතීන් විනාශ කළහ. රටවල් කොල්ල කෑහ. අහිංසක මිනිසුන් ගැහැණුන් ඝාතනය කළහ. ඔහු සිතන දෘෂ්ටිකෝණය අනුව ඊනියා දියුණු සංස්කෘතියක මිනිස්සු ඊනියා නොදියුණු සංස්කෘතියක් මුණ ගැසුණු විට එසේ කරති. ඒ දියුණුවේ ලක්ෂණයකි.

හෝකින් මහතා බටහිර මානවවිද්‍යාඥයකු වූ රෙඩ්ෆීල්ඩ් මහතාගේ මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය පිළිබඳ අදහස් කියවා ඇත්දැයි නො දනිමි. මෙරට බොහෝ සමාජ විද්‍යාඥයෝ ඒ අදහස් පිළිගනිති. ඊනියා මහා සම්ප්‍රදායක් ගැන කතාකරන්නෝ ඔවුහු වෙති. රෙඩ්ෆීල්ඩ්ගේ ප්‍රවාද අවසාන විග්‍රහයේ දී සේවය කරන්නේ යටත්විජිතකරණයට ය. ගම නගරයට යටත්වන්නේ කෙසේ ද යන්න බොරු ශාස්ත්‍රීය විච්චූරණ සහිත ව පෙන්වා දීම ඔහුගේ වෑයම විය. හෝකින් මහතා ඒ අදහස් කියවා ඇතත් නැතත් සංස්කෘතිකව ඒ අදහස් සමග එකඟ වෙයි. වෙනත් වචනවලින් කිවහොත් හෝකින් මහතා විශ්වවේදියකු වුවත් රෙඩ්ෆීල්ඩ් මහතා මානවවිද්‍යාඥයකු වුවත් ඒ දෙදෙනා ම එකම සංස්කෘතියක එකම චින්තනයක ප්‍රවාද (කතන්දර) නිර්මාණය කළහ.

මේ මැතක් වන තුරු ම බටහිරයෝ පිට සක්වළ ජීවීන් වාසය කරන බව නො පිළිගත් හ. ඔවුන් සෙට් නම් ව්‍යාපෘතිය ඔස්සේ දැන් කාලයකට පෙර පිටසක්වල ජීවීන් සෙවීමට පෙළඹුණ හ. තවමත් ඔවුන්ට ඒ ගැන හෝඩුවාවක් නැත. අදත් බොහෝ බටහිරයන් සිතන්නේ පිටසක්වල මිනිසාට වඩා දියුණු ජීවීන් නොමැති බව ය. එයට හේතුව ඔවුන්ට අනුව දෙවියන් වහන්සේ තමන්වහන්සේ ගේ ප්‍රතිබිම්බය වන ලෙස මිනිසා මවා ඇති හෙයිනි. වෙනත් ග්‍රහලෝකවල ජීවීන් ඇතැයි සිතීමට බටහිරයන්ට මැතක්වන තුරුම නො හැකි විය. බොහෝ බටහිර විද්‍යාඥයන්ට අනුව මිනිසාට හැරෙන්නට පෘථිවිය මත ජීවත්වන අනෙක් සතුන්ට මනසක් නැත. අනෙක් සතුන්ට ද මනස් ඇති බවට තම මනසෙහි අදහසක් ඇතිකර ගැනීමට බටහිර සුළු පිරිසකට සිතී තවම වැඩි කලක් නැත. එහෙත් සිංහල බෞද්ධයෝ බොහෝ කලක සිට වෙනත් සතුන්ට ද මනස් ඇති බව මෙන් ම පිටසක්වල ජීවීන් ඇති බව ද දනිති. ඔවුන් ඒ බව දන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුර ඔවුන්ගේ සංස්කෘතියෙහි ඒ දැනුමක් වී තිබීම ය. පිටසක්වළින් ජීවීන් පැමිණයහොත් ඔවුන් කෙසේ ක්‍රියාකරනු ඇත් ද යන්නට සිංහල බෞද්ධයන් දෙන පිළිතුර කුමක් ද? බටහිර දැනුම එකම දැනුම ය යථාර්ථය ය ආදී වශයෙන් සිතන මෙරට සිංහල බෞද්ධ පඬියන් හෝකින්ට හෝයියා යැයි කියනු ඇත. එහෙත් වෙනත් අය පිටසක්වළ දියුණු ජීවීන් ගැන වෙනත් අර්ථකථන දෙනු ඇත. අපට පිටින් ලැබුණු සංස්කෘතීන් පිළිබඳ පළල්

වශයෙන් ගත්කල අත්දැකීම් කිහිපයක් වේ. මා විශ්වාස කරන අයුරින් යක්ෂ ගෝත්‍රිකයන් ද මෙරටට පැමිණ ඇත්තේ වත්මන් ඉරානය අවට ප්‍රදේශයකිනි. ඒ නොපිළිගත්තත්, යක්ෂ ගෝත්‍රිකයන් අනාදිමත් කාලයක සිට මෙරට ජීවත් ව ඇතැයි විශ්වාස කළත් අඩුම තරමින් අපට ආර්ය (අර්ධ වෛදික යැයි අප විසින් හැඳින්වෙන) සංස්කෘතිය හඳුන්වාදීම, දේවානම්පිය තිස්ස රජු දවස තුන්වැනි සංගායනාවෙන් පසු අශෝක බෞද්ධ සංස්කෘතිය හඳුන්වාදීම හා යුරෝපීය කතෝලික සංස්කෘතිය හඳුන්වාදීම හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හඳුන්වාදීම වෙයි.

යක්ෂ ගෝත්‍රිකයන් මෙරටට පැමිණ එවකට සිටි සියළු ජනකොටස් මත තම සංස්කෘතික ආධිපත්‍යය පතුරුවා අනෙක් සංස්කෘතීන් නැතිකිරීමට උත්සාහ ගත් බවට සාක්ෂි නැත. එමෙන් ම අර්ධ වෛදිකයන්ගේ පැමිණීමෙන් පසුව ද එවැනි සංස්කෘතික යටත්විජිතකරණයක් සිදු වී නැත. යක්ෂ ගෝත්‍රිකයන් බොහෝ කල් යන තුරු ම දිගින් දිගට ම තම අනන්‍යතාව රැකගෙන සිටි බවත් වැදි ගෝත්‍රිකයන් මෑතක්වන තුරුම තම සංස්කෘතික අනන්‍යතාව රැකගෙන ඇති බවත් පැහැදිලි ය. (වැදි ගෝත්‍රිකයන් අද සිංහලයන් බවට ක්‍රමයෙන් පත්වෙමින් සිටින්නේ වත්මන් සිංහලයන් ද බටහිර සංස්කෘතික ආධිපත්‍යයට ගොදුරු වී වැදි ජනයා ද සිංහලයන් හරහා බටහිර සංස්කෘතික ආධිපත්‍යයට ලක්කරමින් සිටින බැවින් ය) බෞද්ධ සංස්කෘතිය කෙසේවත් අනෙක් අය මත බලයෙන් පැටවූ සංස්කෘතියක් නො වේ. මිහිඳු මහරහතන් වහන්සේ ඊනියා මිසමක් (මිෂන්) ලෙස අද ඇතැමුන් දකින්නට උත්සාහ කරන්නේ අපේ කසිකබල් බටහිර අධ්‍යාපනයේ කතෝලික හා ක්‍රිස්තියානි මිසම් ආකෘතිය ඔස්සේ ය. උන්වහන්සේ මෙරටට වැඩියේ රජුගේ හිතසුව පිණිස ය. මිහිඳු හිමියෝ රජුට බුදුදහම වැළඳ ගැනීමට බල නො කළහ. මෙරට කිසි දවසක අශෝක රජුගේ යටත්විජිතයක් නො වී ය. එහෙත් අවුරුදු විස්සකට පමණ පෙර ඒ එසේ වී යැයි ද දේවානම්පියතිස්ස රජු දොන් ජුවන් ධර්මපාල කෙනකු වී යැයි ද පෙන්වීමට තැත්කල වත්මන් ඇමතිවරයකු ගැන මෙන් ම මෙරට පඬියන් අතර සම්භාවනාවට පත් වී ඇති හිටපු වෛද්‍ය මහාචාර්යවරයකු ගැන ද මම දනිමි. අවාසනාවකට අපේ අධ්‍යාපනය භාර වී ඇත්තේ එවැනි මහාචාර්යවරුන්ට ය. කතෝලික හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතීන් මෙරටට හඳුන්වා දී ඇති ආකාරය ගැන අටුවා ටීකා අනවශ්‍ය ය.

රුක් දෙවියන් බුමාටු දෙවියන් වැනි ළඟපාත වාසය කරන දෙවිවරුන් හැරෙන්නට බොහෝ දෙවිවරු ඇත්තේ ඉතා ඈත ය. ඔවුන් පිටසක්වළ ජීවීන් ලෙස ගැනීමේ වරදක් නැත. ඒ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ඊනියා විද්‍යාවට එකඟ නොවනවා විය හැකි ය. එහෙත් එවැනි දෙවිවරුන් සමග සම්බන්ධකම් පවත්වන උදවිය ගැන මම දනිමි. (මේ පිළිබඳ විස්තර විදුසර පුවත්පතේ අපේ ප්‍රවාද ලිපි පෙළෙහි ඇත). හෝකින් මහතා නොදන්නා ඒ දෙවිවරු අප යටත්කර ගැනීමට උත්සාහ නො කරති. ඒ හැරත් බෞද්ධ සාහිත්‍යයෙහි පිටසක්වළ ජීවීන් ගැන සඳහන් වෙයි. ඔවුන්ගෙන් ඇතැමෙක් ආධ්‍යාත්මික ව අපට වඩා උසස් ජීවීහු වෙති. ඒ ජීවීන් යම් හෙයකින් පෘථිවියට පැමිණියහොත් කොලම්බස් කළාක් මෙන් අප සමූලඝාතනය කරාවි යැයි අපි සිතමු ද? එසේත් නැතහොත් පෘතුගීසීන් කළාක් මෙන් අපට ඔවුන්ගේ ආගම (සංස්කෘතිය) වැළඳ ගැනීමට බල කරමින් කිරිකැටි බිළිඳුන් උඩ විසිකර ඒ බිළිඳුන් කඩු උඩට වැටෙන සේ කඩු අල්ලා සිටි වී ද? සත්තකින් ම නැත. හෝකින් මහතා අති දක්ෂයෙකි. ඔහු කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ගණිතය පිළිබඳ ලුකේසියන් මහාචාර්යවරයා ව සිටියේ ය. අයිසැක් නිව්ටන් ද ඒ ධුරය දරා ඇත. අද ඒ ධුරය දරන්නේ තන්තුවාදය නිර්මාණය කළ ග්‍රීන් නම් විද්‍යාඥයෙකි. ඔවුහු සියල්ලෝ ම භෞතික විද්‍යාඥයෝ ය (ව්‍යවහාරික ගණිතඥයෝ ය.) එහෙත් ගණිතය පිළිබඳ මහාචාර්යවරු ය. ඒ බ්‍රිතානි ක්‍රමයට ය. ඇමරිකන් ක්‍රමයට ඔවුහු ගණිතය පිළිබඳ මහාචාර්යවරු නො වෙති. මෙරට ඇතැම් ගණිතඥයන්ට ප්‍රශ්නය වී ඇත්තේ අප අනුගමනය කළ යුත්තේ ඇමරිකන් ක්‍රමය ද බ්‍රිතානි ක්‍රමය ද යන්න ය. ඔවුහු එතරම් ම අනුකාරකයෝ වෙති. හෝකින් මහතා කෙතරම් දක්ෂයකු වුවත් ඔහු ලෝකය (විශ්වය) දකින්නේ බටහිර ඇසිනි. ඔහු පිටසක්වළ හා එහි ජීවීන් ගැන මත ප්‍රකාශ කරන්නේ ඔහුගේ සංස්කෘතියට සාපේක්ෂව ය. අපේ සංස්කෘතියට සාපේක්ෂව පිටසක්වළ අපට පෙනෙන්නේ වෙනත් අයුරකිනි. අපේ අධ්‍යාපනය සකස්විය යුත්තේ අපේ සංස්කෘතියට සාපේක්ෂව ලෝකය බැලීමට හා දැකීමට සිසුන් පුරුදු කිරීමට යැයි මම සිතමි. බරණ ගණිතයා ගැන නොදත් බටහිර ගණිතඥයෝ මෙරට එමට වෙති. බෞද්ධ සංස්කෘතිය යනු පාසලේ උදේට පන්සිල් ගෙන දවල්ට යො වද තං පව කියා අතරමැද හෝකින්ට හෝයියා කියා ගෙදර යෑම නොවන බව කතිකාවතට සහභාගි වන විද්වතුන් හා විද්වතියන් දන්නේ දැයි නො දනිමි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva